රඟ මඬල

කලාභූෂණ ගත්කතුවර. සංගීතඥ ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ විශිෂ්ඨ ශ්‍රේණියේ ගායන හා වාද්‍ය ශිල්පී.

ලයනල් ගුණතිලක ලියයි

ශ්‍රී ලංකාවේ ටවර් හෝල් යුගයේ, එනම් වර්ෂ 1911 සිට සිංහල නූර්ති නාට්‍ය කලාව පෝෂණය කළ නාට්‍යකරුවන්, සංගීතඥයින් හා නළු නිළියන්ගේ අප්‍රකට අනගි තොරතුරු අන්තර්ගත ලිපි මාලාව

කිවියර ශ්‍රී රූපදේව ආනන්ද රාජකරුණා

''රෝස මලේ නටුවෙ කටු, වන බඹරෝ ඔහොම හිටු'' යන ඉතාමත් ජනප්‍රිය ළමා ගීතයේ නිර්මාතෘ කිවියර ශ්‍රී රූපදේව ආනන්ද රාජකරුණා නම් වූ විද්වතාණන් බොහෝ දෙනෙකු හඳුන්වනු ලබන්නේ ප්‍රසිද්ධ කිවිවරයාණන් කෙනෙකු ලෙසිනි. එනමුදු එතුමා නාට්‍ය කතුවරයෙකු බව දන්නෝ ඉතාමත්ම අල්පය.

ජාතික ප්‍රබෝධයක්, බුදුධාලම්හන ප්‍රීතියත් එහි ගෞරවයත් සිය පන්හිඳ තුළින් විද්‍යාමාන කළ හෙතෙම ව්‍යක්ත කවිකයෙකි. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ, මාදම්පාගම දක්ෂ දේශීය වෛද්‍යවරයෙකු වූද, ගම්පතියෙකු වූද, විජය වර්ණකුල චාල්ස් තාම්බිවි රාජකරුණා මහතාගේ හා හෙළේනා ද ලිවේරා කරුණාරත්න මහත්මියගේ පුත් අප කතානායකයන්ගේ උපත සිදු වන්නේ ක්‍රි.ව. 1885 ජනවාරි මස 25 වැනි දිනයේදීය. උපන් ස්ථානය අම්බලන්ගොඩ මාදම්පාගම ඌරුවත්තේ සිය නිවසේදීය. පස් හැවිදිරි වියේදීම අකුරුළ ගමෙහි රජයේ පාසලින් සියබස හදෑරිය. එකල බෙහෙවින් ජනප්‍රිය භාෂාවන් වන පාලි හා සංස්කෘත භාෂාවන් මාදම්පාගම අති පූජ්‍ය ධම්මතිලක මහ හිමිපාණන්ගෙන්ද, එකල සිටි ගිහි පැවැදි පඬිවරු ඇසුරින්, කාව්‍ය ශාස්ත්‍රයද, මැනවින් හැදෑරිය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙන්ම සහජ කුසලතාවයන්ද කරන කොට ගෙන අතිශයින්ම ජනප්‍රිය වූ අතර රට තුළ ප්‍රගතිශීලී අදහස් මගින් විශාල සමාජමය පෙරළියක් ද ඇති කළේය. කොළඹ ආනන්ද විද්‍යාලයේ ඉංග්‍රීසි ගුරු සේවයේ යෙදී සිටි කාල වකවානුවේ, එකළ තවත් ජනප්‍රිය නාටක කතුවරයෙකු වූ හිතිඥ චාල්ස් ඩයස් අමරතුංග මහතාණන් සමග කුලුපග විය. එම ඇසුරින් මෙතුමාද නාට්‍යකරණයට යොමු වී ගී සින්දු යනාදිය රචනා කළේය.

එම ගී සින්දු හා කවි ගායනා එකල අතිශයින් ජනප්‍රිය විය. එම ගීත ග්‍රැමෆෝන් තැටි ඔස්සේ ප්‍රචාරය කරමින් මහඟු සේවයක් සිදු කළේය. හෙළයන් සතු මහානාර්ඝ ජාතික සිරිත් විරිත් සමුදායේ හරය හා අගය සිය ජනතාවට මනාව වටහා දුන්නේය.

ආනන්ද රාජකරුණා නම් නාට්‍ය රචකයාණන් විසින් රචිත නාට්‍ය සියල්ල වේදිකා ගත කර ඇත්තේ, ටවර් හෝල් රංග ශාලාවේදීය. 1914 ''උතුවන්කන්දේ සරදියෙල්'', ''කුමරි බඹසර'' 1922 දී දොන් කොස්මෝ චරිතය ඇතුළු තවත් නාට්‍ය ඒ අතර වේ. එපමණක් ම නොව ඉතාමත් රසවත් හරවත් කාව්‍ය ග්‍රන්ථ රාශියක් රචනා කළේය. එකල බෙහෙවින් ජනප්‍රිය කවි සම්මේලන වල උපහාසය දනවන කවි ගායනා සිය මධුරස්වරයෙන් ගායනා කිරීම නිසාම රසිකයෝ අමන්දානන්දයට පත්වූහ. සම්බුද්ධ ශාසනය, ආනන්ද චම්පූ, කවි මල්දම, නන්දාවතී, උද්‍යානය, ජාතික දරු නැලවිල්ල, නමෝතේ මාතා, ළදරු ගී, ජාතික පඩුර, කවට කුරුළු සංදේශය, ආනන්ද රචනා, කවිරස අමුණ, නිල් ලිහිණි සන්නය, ආදී ගද්‍ය පද්‍ය කෘතීන් තුළින් ජාතිකාභිමානය, පරසිරිත් පරවම්හනය මෙන්ම ජාතික අනුරාගය උද්දීපනය කිරීමට නිතැතින්ම කැපවිය.

උපතින් ලද නාමය වූ ආනන්ද රාජකරුණා නාමයට ගෞරවනීය ලෙන්ගතු නාමයක් පිරිනමා ඇත්තේ වස්කඩුවේ ශ්‍රී සුභූති මහ නාහිමියන් ප්‍රධාන සංඝ සභාවෙනි. එම නාමය නම් ''ශ්‍රී රූප දේව'' ආනන්ද රාජකරුණා වශයෙනි. ඉන් පසු ශ්‍රී ලාංකික සකල ජනතාවම භාවිතා කරන ලද්දේ ඉහත සඳහන් ගෞරවනීය ලෙන්ගතු නාමයෙනි. එතුමන්ගේ කවි සිතුවිලි ධාරාවන් ඔස්සේ ජාතියට තිළිණ කරන ලද කාව්‍ය සිලිලාරෙන් දිය බිඳුවක් දෙකක් මෙසේ දක්වමි.

එම කාව්‍ය රචනා තුළ ඇති ප්‍රබලත්වය මනාව පිළිබිඹු වන බව සක්සුදක් සේ පැහැදිලිය. කියවා රස විඳින්න.

ළමා කවියක්.

රෝස මලේ නටුවෙ කටු
වන බඹරෝ ඔහොම හිටු
නටුව නොවේ මල සිඹිමි
මම ළමයෝ පැණි උරමි
වන බඹරෝ මෙහෙම මලක්
පැණි තොපටයි මල අපටයි

ව්‍යාංගාර්ථයෙන් රචනය කර තිබෙන මෙම කවියේ ඇති රසය කොතරම් අගේද යන්න විමසා බලන්න.

උඩින් යටින් ගිනි මැද පිටි පොඩිත්තයි
මැදයි නොවේ වාටිය ගැන කැමැත්තයි
පෙරත් සිටම සිංහලයගේ අමුත්තයි
මටත් එකක් නොදෙනොත් තද අයුක්තයි

දන්ත හා මූර්ධප්ප අකුරු ඇසුරින් යුත් මේ කවියෙන්ද ආස්වාදය ජනක අරුතක් ඇති නොවන්නේද ?

ජාතික නිදහසේ මහිමය මෙම කවියෙන් ප්‍රකාශ වේ.

සිරි සල දළ දහම් තිලක
සිරි සළ දළ දහම් තිලක

සිරි සද ලළ දහම් තිලක
සිරි සල දළ දහම් තිලක

නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහි කොට මෙලො වේ
යුතු කම ඉටු කළ යුතු වේ

හිතාදර පාඨකය ඔබට මෙම කාව්‍ය ප්‍රබන්ධ කෙතරම් අරුතක් ගෙන දෙන්නේ දැයි වැටහෙනු නොවනු මානයි. මෙවැනි අගනා නිර්මාණ ජාතියට තිළිණ කළ මෙම විද්වතාණන් සසර කළකිරි ගිහි ජීවිතයට සමු දී ''ආනන්ද ධම්ම'' නමින් පැවිදිව සම්බුද්ධ ශාසනයට ඉමහත් සේවයක් ඉටු කර ක්‍රි.ව. 1957 අගෝස්තු මස 27 වැනි දින අපවත්වී වදාළහ.

මෙම විද්වතාණන්ගේ ශ්‍රේෂඨ නාමයට ගෞරවයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කොළඹට ආසන්න බොරැල්ල ප්‍රදේශයේ ආනන්ද රාජකරුණා නමින් මාවතක් නම් කර තිබේ. මෙම පැවිදි පඬිවරයාගේ හර බර කවි සංග්‍රහයකින් යථා කාලයේ ඔබව රසවත් කරන්න අපෙක්ෂා කරමින් ලිපිය සමාප්ත කරමි. ඊළඟ ලිපිය නාට්‍ය කතුවර ආර්. ජෝන් පෙරේරා සූරීන්ට උපහාරයක් වශයෙන් ඉදිරිපත් කෙරේ.

(ලිපිය සකස් කිරීමේදී ආර්.එම්.ඒ. රත්නායක මහතාගේ ශ්‍රී ලංකාවේ නාට්‍ය කතුවරු කෘතිය බෙහෙවින් උපකාරී වූ බව ගෞරවයෙන් සඳහන් කරමි)

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

(ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
DR. PREMA KUDALIGAMA
(BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com